(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 13(13).]

# පාර්ලිමේන්තුවේ අංක 13 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2015 අප්‍රේල් මස 21 වැනි අඟහරුවාදා

## 2015 මැයි මස 05 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4787/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යුද්ධය නිමකිරීම සඳහා පොලිස් නිලධාරීන් හා පොලිස් විශේෂ කාර්ය බලකායද සම්බන්ධ වූ බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඔවුන් රණවිරුවන් ලෙස පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) රණවිරුවන් දිරිමත් කිරීම සඳහා පවත්වනු ලබන ''රණවිරු රියල් ස්ටාර්'' තරගාවලියට පොලිස් නිලධාරීන් සහභාගී කර නොගැනීමට හේතු කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4987/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2013 වර්ෂයේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය පැවැත්වීම සඳහා,

(i) ස්ථාපිත කළ මධ්‍යස්ථාන;

(ii) එම මධ්‍යස්ථාන සම්බන්ධීකරණය කිරීම සඳහා ක්‍රියාත්මක වූ සම්බන්ධීකරණ මධ්‍යස්ථාන;

(iii) සේවයේ යොදවාගත් ශාලාධිපතිවරු;

(iv) යොදාගත් ගුරුවරු;

(v) යොදා ගත් ශාලා කාර්ය සහායකයන්;

සංඛ්‍යාව කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ)(v)හි සඳහන් ශාලා කාර්ය සහායකයින්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ඉහත නම් සඳහන් ශාලා කාර්ය සහායකයින්ගෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් සේවක සංඛ්‍යාව සහ එම ක්ෂේත්‍රයට අයත් නොවන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) උක්ත විභාගයේ කටයුතු සඳහා බාහිරව බඳවා ගත් ශාලා කාර්ය සහායකයින්ගේ වැටුප් හා දීමනා වෙනුවෙන් ගෙවූ මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) අධ්‍යාපන අනධ්‍යයන සේවකයින් සිටියදී බාහිර පුද්ගලයන් විභාග කටයුතු සඳහා යොදා ගැනීම නිසා එම සේවකයන්ට දීමනාවක් ලබා ගැනීමට ඇති අවස්ථාව අහිමි වීම වැළැක්වීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

5436/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සීමාසහිත ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්තය සතු මුතුරාජවෙල ටැංකි සංකීර්ණය සඳහා ආනයනය කළ ඩීසල්වල ගෙන්දගම් ප්‍රතිශතය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඉන්ධන පිරවුම්හල්වල විකිණීමට ඇති ලංකා ඔටෝ ඩීසල් සහ සුපර් ඩීසල්වල ඇති ගෙන්දගම් ප්‍රතිශතය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ගම්පහ දිස්ත්‍රික්කය තුළ ඇති ඉන්ධන පිරවුම්හල්වලට ලංකා ඔටෝ ඩීසල් හා සුපර් ඩීසල් ලබා දෙන්නේ කුමන ඛනිජ තෙල් ගබඩා පර්යන්තයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5845/'14

ගරු මොහමඩ් අස්ලම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ, අංක 32, කුප්පියාවත්ත බටහිර කොට්ඨාසයට අයත්, හික්කඩුව ශ්‍රී සුමංගල හිමි මාවතේ, වරිපනම් අංක 108 සහ 108/20 දරන ස්ථානයන්ට ප්‍රවේශ වන මාර්ගයට බාධා වන අයුරින්, නාගරික පොදු වැසිකිළි පද්ධතිය මත අනවසර ඉදිකිරීමක් සිදුකොට තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) කොළඹ මහ නගර සභාවේ ඇතැම් නිලධාරීන්ගේ අනුග්‍රහය මත සිදු කරන ලද එකී අනවසර ඉදිකිරීම් නිසා පොදු වැසිකිළි පද්ධතිය පුද්ගලික දේපළක් බවට පත්වී තිබෙන හෙයින්, එම ඉදිකිරීම් නොපමාව ඉවත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5919/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය ජනාධිපතිවරණ සමයේදී චීන වරාය, නුවර පාර, සමනළ මාවත, අංක 49/1 දරන ස්ථානයේ ක්‍රියාත්මක වූ ලියාපදිංචි මැතිවරණ මෙහෙයුම් කාර්යාලයක පෞද්ගලික මුදලින් මිලදී ගෙන ගබඩා කර තිබූ, ගංවතුර ආධාර ලෙස බෙදා ඉතිරි වූ භාණ්ඩ තොගයකට උසාවි නියෝගයක් මත පොලීසිය මඟින් මුද්‍රා තබා නඩු කටයුත්තකට යොමු කරනු ලැබුවේ කුමන හේතුවක් මත, කාගේ පැමිණිල්ලකට, කාගේ නියෝගයක් මතද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මුද්‍රා තබා ඇති ඉහත සඳහන් භාණ්ඩ වැඩි ප්‍රමාණයක් දෛනික පරිභෝගික භාණ්ඩ වන බැවින් ඒවාට සිදුවිය හැකි හානි වෙනුවෙන් පොලිස් දෙපාර්තමේන්තුව විසින් වගකියනු ලබන්නේද;

(ii) ඉහත සිද්ධිය වූ දිනම එකී කාර්යාල පරිශ්‍රයේ තිබූ එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අයත් WP PA 4549 දරන ඩබල් කැබ් රථය එහි රියැදුරු විසින් නැවත සේවා ස්ථානයට රැගෙන යමින් සිටියදී අත්අඩංගුවට ගත් පදනම සහ එම පැමිණිල්ල ඉදිරිපත් කළ අය කවරහුද;

(iii) ඉහත සඳහන් ආකාරයේ අත්තනෝමතික සිද්ධීන් යළි සිදු නොවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5922/'15

ගරු විදුර වික්‍රමනායක මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හොරණ, හැගල්ල සිට ලබුගම හන්දිය දක්වා මාර්ගය, හොරණ සච්ගස් හන්දිය සිට කුඩා උඩුව දක්වා තල්ගහවිල මාර්ගය, හොරණ, කුළුපන සිට ඔලබොඩුව දක්වා මච්ගම මාර්ගය සහ හොරණ, ඕව්ටියාගල හේන්කන්ද හරහා උඩුව මාර්ගය යන මාර්ගවල උරහිස් පළුදු කිරීමට බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අනුමතිය ලබා නොදීම නිසා, එම ප්‍රදේශවල ජනතාවට පානීය නල ජලය ලබා දීම සඳහා අනුමතව ඇති ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එම ප්‍රදේශවල ජනතාවට පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා, කාපට් අතුරා වසර පහකටත් වඩා කල්ගතවී ඇති ඉහත සඳහන් මාර්ගවලට අවම හානියක් වන පරිදි, එකී මාර්ගයන්හි උරහිස් පළුදු කිරීම සඳහා අවසරය ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5931/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සුනාමි ව්‍යවසනයෙන් නිවාස අහිමි වූ මාතර දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දුන් නිවාස සඳහා මේ වන විට ඔප්පු ලබා දී තිබේද;

(ii) එම ඔප්පු ලබා දී නොමැති නම්, ඊට හේතු කවරේද;

(iii) දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දගොඩැල්ල (H.H.O. නිවාස), අභිමන්පුර, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදවත්ත (ලුණුකලපුව), මුදියන්සේවත්ත සහ මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගාල්ලගේවත්ත, තුඩාව, කොඩිකාර ගොඩනැගිල්ල සහ ලොරන්ට සිටි යන ස්ථානවල ලබා දී ඇති නිවාස සඳහා ස්වාධීනමය දේපළ ලෙස හෝ තනි තනි නිවාස ලෙස හෝ ඔප්පු ලබා දිය හැකි බවට ජාතික නිවාස අධිකාරිය නිර්දේශ කර තිබේද;

(iv) එම නිවාසවලට ඔප්පු ලබාදීමේ කාර්යය සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට පැවරීම සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර තිබේද;

(v) සහාධිපත්‍ය දේපළ පදනමින් හෝ තනි නිවාස අයිතිය යටතේ හෝ ඉහත (iii) හි සඳහන් නිවාසලාභීන්ට ඔප්පු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5939/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගරු ශිරානි තිලකවර්ධන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමියගේ සභාපතිත්වයෙන් පත්කරන ලද ආයුධ ජාවාරම ගැන විමසා බැලීම සඳහා වූ කොමිසම විසින් වාර්තාවක් සකසා තිබේද;

(ii) එම වාර්තාව ප්‍රකාශයට පත් කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4999/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ට පිළිවෙළින් රු.15,000.00ක් සහ රු.5,000.00ක්ද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුබද්ධ සැලසුම් අධ්‍යක්ෂවරුන්ට හා ප්‍රධාන ගණකාධිකාරීවරුන්ට රු.3,000.00ක් ද වශයෙන් දිරි දීමනා ලබා දෙන බවට වූ 2014 අයවැය යෝජනාව මේ වන විට ඉටු කර තිබේද;

(ii) එසේ නම්, එම දීමනා ලබා දීම ආරම්භ කළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුබද්ධ සැලසුම් අධ්‍යක්ෂවරුන්ට හා ප්‍රධාන ගණකාධිකාරීවරුන්ට අඩු වටිනාකමකින් යුතු දිරි දීමනාවක් ගෙවීමට යෝජනා කිරීමට හේතු කවරේද;

(ii) අඩු වටිනාකමකින් යුතු දිරි දීමනාවක් ගෙවීමට තීරණය කිරීම නිසා ඉහත (i) හි සඳහන් නිලධාරීන්ගේ සේවය අවතක්සේරුවීමක් සිදුවී ඇති බව එතුමා පිළිගන්නේද;

(iii) එසේ නම්, ඔවුන්ගේ දිරි දීමනා ඉහළ දැමීමට කටයුතු කරන්නේද;

(iv) එම වැඩි කරනු ලබන ප්‍රමාණය කොපමණද;

(v) එම වැඩි කිරීම සිදු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5224/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ඇති මුඩුක්කු නිවාස හා ලැයිම් කාමර සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) දිස්ත්‍රික්කයේ සිටින නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැසිකිළි නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) වැසිකිළි නොමැති නිවාස සඳහා වැසිකිළි ලබා දීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5920/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍ර සහිතව මෙන්ම රහිතව අලි ඇතුන් රඳවා සිටින ස්ථාන සොයා ගොස් අත්අඩංගුවට ගැනීම් සිදු කර අදාළ බලපත්‍රවල නිරවද්‍යභාවය තහවුරු කර ගැනීමටත් පෙර එම සිද්ධි ප්‍රසිද්ධ මාධ්‍ය මඟින් අපහාසාත්මක ලෙස ප්‍රචාරය කිරීමේ වැඩ සටහනක් තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) පසුගිය ජනාධිපතිවරණයෙන් පසු අත්අඩංගුවට ගත් බලපත්‍ර සහිත අලි - ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍රලාභීන්ගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(iii) එකී කාල සීමාව තුළ අත්අඩංගුවට ගත් බලපත්‍ර රහිත අලි - ඇතුන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම බලපත්‍ර රහිත අලි - ඇතුන් රඳවාගෙන සිටි අයගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක කවරේද;

(v) අත්අඩංගුවට ගෙන ඇති අලි - ඇතුන් රඳවා ඇති ස්ථානය කවරේද;

(vi) ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය කවරේද;

(vii) නීත්‍යානුකූලව නැවත භාර දිය යුතු අලි - ඇතුන් හඳුනාගෙන තිබේද;

(viii) එසේ නම්, ඔවුන් නැවත භාර දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5932/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවයේ නියුතු සංස්කෘතික නිලධාරීන් සහ සංස්කෘතික සංවර්ධන සහකාරවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) රාජ්‍ය සේවයේ අනෙකුත් නිලධාරීන්ට හිමි උසස්වීම් එම පිරිසට ද අදාළ වන්නේද;

(iii) එසේ නම්, උසස්වීම් ලබාදීමට අදාළ සේවා කොන්දේසි කවරේද;

(iv) එම නිලධාරීන්ට උසස්වීම් ලබාදීම අදාළ නොවන්නේ නම්, ඔවුන් විශ්‍රාම යන අවස්ථාවේ දරනු ලබන තනතුර දැනට දරන තනතුරම වන්නේද;

(v) එම නිලධාරීන්ට උසස්වීම් ලබාදීමට අදාළ කැබිනට් අනුමතිය මීට පෙර ලැබී තිබේද;

(vi) එසේ නම්, එම අනුමතිය ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

(vii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 යටතේ සහකාර සංස්කෘතික නිලධාරී තනතුරු මේ වන විට අහෝසි කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5225/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහා මාර්ග සංවර්ධනය සඳහා දේශීය බැංකු මගින් මුදල් ලබා දෙන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් ලබා දී ඇති දේශීය බැංකු කවරේද;

(ii) එම එක් එක් බැංකුව මගින් ලබා දී ඇති මුදල් ප්‍රමාණය සහ මුදල් ලබා දී ඇති මහා මාර්ග ව්‍යාපෘති වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) ලබා දුන් මුදල් නැවත බැංකු වෙත ලබා ගැනීමේ ක්‍රමවේදය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5722/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස, හුලංදාව වතුයාය ආශ්‍රිතව ජීවත් වන ජනතාවට අවම මූලික පහසුකම්වත් නොමැති බවත්;

(ii) එම නිසා එම ජනතාව දැඩි අපහසුතාවන්ට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හුලංදාව වතුයාය ආශ්‍රිතව වෙසෙන ජනතාවට අවශ්‍ය පානීය ජලය, මාර්ග පහසුකම් සහ නිවාස හා සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

(iii) එම පියවර ගනු ලබන දිනය කවරේද;

(iv) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5927/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මායිම්ව, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි, තෙන්නමරවාඩිය ග්‍රාම නිලධාරි වසමෙහි හා තදාසන්න ප්‍රදේශයට අයත් තොරංකාඩුව, 2 කණුව, 4 කණුව, තෝරමරිප්පු, බොරවැව, කුල්ලකල්ලිය, නෙළුම්වැව යනාදී ගම්වල පදවි ව්‍යාපාරය යටතේ පදිංචි කර සිටි පැරණි භුක්තිකරුවන් හා නව හිමිකරුවන් අතර ඉඩම් ගැටලුවක් උද්ගත වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එල්. ටී. ටී. ඊ. ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් උක්ත ප්‍රදේශවලින් පැරණි භුක්තිකරුවන් ජීවිත ආරක්ෂාව පතා ඉවත් වූ පසු, එම ඉඩම්වලට දීමනාපත්‍ර (LDO) ලබා දී අලුත් පිරිසක් පදිංචි කරවූ අය කවුරුන්ද;

(ii) එසේ පදිංචි වූ අයගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) වාර්ෂික බලපත්‍ර මත එකී ඉඩම්වල පදිංචිව සිටි පැරණි භුක්තිකරුවන් කවුරුන්ද;

(iv) ඔවුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත ඉඩම්වල නීත්‍යානුකූල හිමිකාරීත්වය ඇත්තේ පදවිය ව්‍යාපාරය යටතේ මුල් භුක්තිකරුවන්ටද; නොඑසේ නම්, දීමනාපත්‍ර මත පසුව පදිංචි කරවූවන්ටද;

(ii) ඉහත ගැටලුව නිරවුල් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

(iii) එම ක්‍රියාමාර්ගය ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

**2015 මැයි මස 06 වැනි බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4788/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) එක් වර්ෂයක් තුළ යල සහ මහ කන්න දෙක වගා කිරීම සඳහා අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(ii) දැනට රට තුළ නිෂ්පාදනය කරන බිත්තර වී ප්‍රමාණය කොපමණද;

(iii) අවශ්‍ය බිත්තර වී ප්‍රමාණය නිෂ්පාදනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iv) බීජ නිෂ්පාදනය වැඩි කිරීම සඳහා ජාතික බීජ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5141/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය සඳහා මිනිස්බල සේවා සපයන ආයතන හරහා යොදවා සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයින් සේවයේ යොදවා ගෙන සිටින කාල සීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂය තුළ දී ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය සඳහා සෘජුවම බඳවා ගත් සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සේවකයින් බඳවා ගැනීමේදී පලපුරුදු සේවා කාලයක් සහිත, ඉහත (අ)(i) හි සඳහන් සේවකයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

(iv) 2014 වර්ෂයේදී බඳවා ගත් මුළු සේවක සංඛ්‍යාව තුළ (අ)(i) හි සඳහන් සේවකයින්ගෙන් තේරී පත් වූ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5708/'14

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2011 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව 2011 ජන සෙවණ නිවාස දස ලක්ෂය නිවාස සහ ජනාවාස මෙහෙයුම යටතේ මොණරාගල දිස්ත්‍රික්කය තුළ නිවාස පහසුකම් ලබාදීමට හඳුනාගත් මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී යෝජනා ක්‍රමය යටතේ නිවාස පහසුකම් ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම යෝජනා ක්‍රමය සඳහා වැය කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එකී මුදල් ලබා ගත් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 ජන සෙවණ නිවාස දස ලක්ෂය නිවාස සහ ජනාවාස මෙහෙයුම යටතේ නිවාස පහසුකම් ලබාදීමට හඳුනාගත් පවුල් වෙත ලිඛිත පොරොන්දුවක් ලබා දී තිබුණේද;

(ii) එකී පොරොන්දුව අනුව මෙතෙක් නිවාස ලැබී නොමැති පවුල් සඳහා නිවාස ලබා දීමට පියවර ගන්නේද;

(iii) ඒ සඳහා ගත වන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5723/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සංචාරක වීසා මත ශ්‍රී ලංකාවට පැමිණ නීති විරෝධී ලෙස රට තුළ රැඳී සිටිමින් විවිධ ආගම් ප්‍රචාරය කළ, විවිධ රැකියා හා ව්‍යාපාරවල නිරතවූ හා සමාජ විරෝධී කටයුතුවලට සම්බන්ධ වූ සංචාරකයන් කොපමණ සංඛ්‍යාවක් 2014 වර්ෂය තුළ අත්අඩංගුවට ගෙන තිබේද;

(ii) ඔවුන් අයත් රටවල් කවරේද;

(iii) අත්අඩංගුවට ගත් එම එක් එක් පුද්ගලයා විසින් සිදු කරන ලද නීති විරෝධී කටයුත්ත හා ලබාදුන් දඬුවම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංචාරක වීසා මත පැමිණ නීති විරෝධීව රට තුළ රැඳී සිටින විදේශිකයන් අත්අඩංගුවට ගැනීමට විශේෂ වැඩපිළිවෙළක් සකසා තිබේද;

(ii) මේ සම්බන්ධයෙන් බලාත්මක වන නීති රෙගුලාසි තවදුරටත් දැඩි කිරීමට කටයුතු කරන්නේද

(iii) එසේ නම්, ඒ කුමන ආකාරයෙන්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5928/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, පුල්මුඩේ පිහිටි, අසිරිමලේ ආසිරිකන්ද පුරාණ රජ මහා විහාරයට අයත් ඉඩම් ඇතුලු පූජනීය දේපළ විවිධ ජාතීන්ගේ අනවසර ග්‍රහණයන්ට ලක්ව ඇති බැවින් එකී විහාරස්ථානයට අයත් ඉඩම් ඉපැරණි සීමා වෙන් කිරීම් අනුව මැන නීත්‍යානුකූලව වෙන්කර දෙන දිනය කවරේද;

(ii) ඇතා නැගි කන්ද විහාරය, යාන්ඔය රජ මහා විහාරය, නාගලෙන රජ මහා විහාරය සහ වෙනත් පෞරාණික විහාරස්ථාන ද අනවසර පදිංචිකරුවන්ගේ හා බෞද්ධ උරුමයන් විනාශ කරන්නන්ගේ ග්‍රහණයට හසුව ඇති බැවින් එම විහාරස්ථානවලට අයත් ඉඩම්වල මැනුම් කටයුතු සිදුකර වෙන්කර දෙන දිනය කවරේද;

(iii) ඉහත විහාරස්ථානවලට අයත් ඉඩම් බව නොදැන එම ඉඩම්වල පදිංචි වී සිටින පවුල් සඳහා වෙනත් ප්‍රදේශයකින් ඉඩම් ලබාදීමට කටයුතු නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් එක් එක් විහාරස්ථානයට අයත් ඉඩම්වලින් මේ වන විට ඉවත් කළ යුතු බවට හඳුනාගෙන ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පදිංචිකරුවන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6019/'15

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අවතැන්ව වෙනත් රටක ජීවත්වන ශ්‍රී ලාංකිකයන් නැවත මෙරටට පැමිණෙන විට අත්අඩංගුවට ගැනීම් සිදුවන්නේද;

(ii) එසේ නම්, එම අත්අඩංගුවට ගැනීම් කුමන නීති ප්‍රතිපාදනය යටතේ සිදු කරනු ලබන්නේද;

(iii) එසේ අත්අඩංගුවට ගන්නා ලද තැනැත්තන් පිළිබඳ විස්තර සභාගත කරන්නේද;

(iv) එම තැනැත්තන්ට අදාළව අධිකරණ කටයුතු සිදු කොට තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6035/'15

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ එක් දිනක් තුළ සිදු වන දරු උපත් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දරුවන් සියලු දෙනාටම රු. 20,000.00 දීමනාවක් ලබා දෙන්නේද;

(iii) ඒ සඳහා වාර්ෂිකව වැය වන මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2015 අයවැයෙන් ඉහත දීමනාව ලබා දීම සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(ii) වෙන් කරන ලද එම මුදල එකී දීමනාව ලබා දීමට ප්‍රමාණවත් වන්නේද;

(iii) නොඑසේ නම්, ප්‍රමාණවත් මුදලක් වෙන් කර දෙන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6046/'15

ගරු විජිත හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 19 වැනි වගන්තිය අනුව එම අරමුදලේ ප්‍රාරම්භක භාරකරුවන්නේ වෙළඳ විෂය භාර අමාත්‍යවරයා බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වත්මන් වෙළඳ විෂය භාර අමාත්‍යවරයා කවුරුන්ද;

(ii) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලයේ භාරකරුවන් හා භාරකාර මණ්ඩලයේ සභාපතිවරයා කවුරුන්ද;

(iii) එම භාරකරුවන් පත්කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) (i) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර මණ්ඩලය යටතේ පවත්නා නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සහ නැට්වෙල්ත් සෙකුරිටීස් සමාගම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කරනු ලබන්නේ කවුරුන් විසින්ද;

(ii) ඉහත සමාගම් සඳහා අධ්‍යක්ෂවරුන් පත්කළ දිනය කවරේද;

(iii) එම අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ වයස කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4793/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයිනේ ලියාපදිංචි සමස්ත උපාධිධාරීන් අතරින් බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව හා අභ්‍යන්තර උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂයක් තුළ දී රජයේ විශ්ව විද්‍යාල සඳහා ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ දින සිට විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කර ගැනීම දක්වා ගත වන කාල සීමාව කොපමණද;

(iv) මේ වන විට එම කාල සීමාව වර්ෂයකට ද වැඩි කාල සීමාවක් බවට පත්වී ඇති බව දන්නේද;

(v) එම තත්ත්වයට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල නිකුත්කිරීමෙන් පසු ඉතා ඉක්මනින් විශ්වවිද්‍යාල සඳහා ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සඳහා යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5754/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බෝගම්බර බන්ධනාගාරයෙන් රැඳවියන් ඉවත් කළ පසු එය පිරිසිදු කිරීම සඳහා වැය කළ මුදල කොපමණද;

(ii) එම මුදල සපයාගත් මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෝගම්බර බන්ධනාගාරය වර්තමානයේ කුමන කටයුත්තක් සඳහා භාවිතා කරනු ලබන්නේද;

(ii) එහි අයිතිය පෞද්ගලික ආයතනයකට හෝ පුද්ගලයෙකුට පවරා තිබේද;

(iii) එසේ නම්, එම ආයතනයේ හෝ පුද්ගලයාගේ නම, ලිපිනය හා දුරකථන අංක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5929/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය - කොඩ්බේ ධීවර වරායේ පිහිටි, විශාල ආදායමක් ලබා ගත හැකි ආපනශාලාව ඉතා අඩු මුදලකට ලබාදීමෙන් රජයට ලැබිය යුතුව තිබූ සැබෑ ආදායම අහිමි වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී ආපනශාලාව පවත්වාගෙන යෑමට ටෙන්ඩරය ලබා දී ඇති අයගේ නම, ලිපිනය හා දුරකථන අංක කවරේද;

(ii) 2015.03.05 දින එම ටෙන්ඩර්ලාභියා හා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර ඇති කරගෙන තිබෙන ගිවිසුම මඟින් එම ආපනශාලාවේ මාසික කුලිය රු. 10,000/- දක්වා අඩු කිරීමට හේතුව කවරේද;

(iii) ඉහත සඳහන් ටෙන්ඩර්කරු විසින් පසුගිය කාල සීමාව තුළ දිගින් දිගටම නියමිත බදු මුදල් නොගෙවා එම ආපන ශාලාව පාලනය කර ඇති බවට චෝදනා ලබා තිබියදීත්, රජයට විශාල මුදලක් අහිමිවන පරිදි ඉහත අයුරින් කටයුතු කිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත ආපනශාලාව සඳහා ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමක් සිදු නොකිරීමට හේතු කවරේද;

(ii) ඉදිරියේදී ඊට අදාළව ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීමක් සිදු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5755/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2014 දක්වා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ජනතාවගේ පරිභෝජනය සඳහා නිකුත් කළ ජලය ලීටර් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) දැනට නල ජල පහසුකම් ලබා ගන්නා මුළු පාරිභෝගිකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පාරිභෝගික සංඛ්‍යාව සමස්ත ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වන විට නල ජල පහසුකම් නොමැති, එහෙත් ජල පහසුකම් අත්‍යාවශ්‍ය ජනතාව පිළිබඳ සමීක්ෂණයක් කර තිබේද;

(ii) එසේ නම්, එම සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන්ට අවශ්‍යවන ජල ලීටර් ප්‍රමාණය ඇස්තමේන්තු කර තිබේද;

(iv) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

(v) එම ජල ප්‍රමාණය සපයා ගැනීමට ප්‍රමාණවත් ජල මූලාශ්‍ර රට තුළ තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මුහුදු ජලය පිරිපහදු කර පානීය ජලය ලෙස ජනතාවට ලබාදීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5930/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පැවති රජයේ අමාත්‍යවරුන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්ය මණ්ඩලයන්හි තනතුරු දැරූ අයගේ රැකියා 2015.01.09 දින සිට අවසන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අමාත්‍ය කාර්ය මණ්ඩලවල සිටි සාමාජිකයින්ට තම සේවය අවසන් වූ ඉහත දිනය දක්වා හිමි මාසික වේතන, අතිකාල හා ගමන් වියදම් දීමනා නොගෙවීමට හේතුව කවරේද;

(ii) එම සේවකයින් විසින් සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමට නිසි පරිදි ඉල්ලුම් කළද, අදාළ ප්‍රතිලාභ ලබා නොදීමටත්, පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අයත් වූ එකී නිලධාරීන්ගේ එම අයදුම්පත් පවා භාර නොගැනීමටත් හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අමාත්‍ය කාර්ය මණ්ඩල ලේකම්වරුන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීමට අදාළ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 06/2011ට අනුව අවුරුදු 5ක සේවා කාලය සම්පූර්ණ කර ඇති එකී ලේකම්වරුන්ගේ විශ්‍රාම වැටුප් සැකසීම සඳහා ඔවුන් පෙර සේවය කරන ලද අමාත්‍යාංශ විසින් සේවා කාලය තහවුරු කිරීම හා චර්යා සටහන් ලබාදිය යුතුව ඇතත්, බොහෝ අමාත්‍යාංශ වරින්වර අහෝසි වී ඇති තත්ත්වය යටතේ එම විෂයයන් දැනට පැවරී ඇති අමාත්‍යාංශ එකී වගකීම පැහැර හැරීමට හේතුව කවරේද;

(ii) ඉහත සඳහන් ගැටලු කඩිනමින් නිරවුල් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2015 මැයි මස 07 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4589/'13

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) විදේශීය රටවල රැකියා සඳහා ගොස් සිටින රට විරුවන්ට විශ්‍රාම වැටුපක් ලබාදීම සඳහා 2010 ජනාධිපතිවරණයට පෙර පොරොන්දු වූ බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, රට විරුවන් සඳහා විශ්‍රාම වැටුපක් ලබාදීමට අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) රට විරුවන් සඳහා විශ්‍රාම වැටුප ලබාදීමේදී රට විරුවන්ගෙන්, රැකියා ආයතනයෙන් සහ රජය මඟින් දායකත්වය දරනු ලබන ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම විශ්‍රාම වැටුප ලෙස මාසිකව ලබාදීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iv) විදේශ රැකියාවල නියුතුවූවන්ට විශ්‍රාම වැටුප් ලබා දෙන ලෝකයේ වෙනත් රටවල් කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4783/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2005 සිට 2013 දක්වා කාල සීමාවේදී,

(i) කුරුණෑගල දිස්ත්‍රික්ක තුළ වන අලි පහරදීම් නිසා මිය ගිය පුද්ගලයින් සංඛ්‍යාව;

(ii) මිනිස් ක්‍රියාකාරකම් නිසා එම දිස්ත්‍රික්කය තුළ මිය ගිය වන අලි සංඛ්‍යාව;

(iii) සමස්ත දිවයින තුළ මියගිය වන අලි සංඛ්‍යාව;

වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5272/'14

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොලිස්පති චක්‍රලේඛ 2416/2013 සහ ආයතන චක්‍රලේඛ 01/2013 යටතේ "2013 පොලිස් නිලධාරීන්ගේ දීමනා වැඩි කිරීමට" යටත් නොවන පොලිස් නිලධාරීන් කොට්ඨාස හෝ නිලධාරීන් සිටින්නේද;

(ii) එසේ නම්, එම පොලිස් නිලධාරී කොට්ඨාසයන් හෝ නිලධාරීන් කවරේද;

(iii) ඉහත චක්‍රලේඛ අනුව එම කොට්ඨාසයේ නිලධාරීන්ගේ දීමනා වැඩි නොකිරීමට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා පොලිස් ඉංජිනේරු සේවයෙහි යෙදෙන්නන් පොලිස් නිලධාරී ගණයට අයත් නොවන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5907/'15

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වන විට මරණ දඬුවමට ලක් වී බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට ජීවිතාන්තය දක්වා සිරදඬුවම් ලබා බන්ධනාගාරගතව සිටින සිරකරුවන්ගේ සංඛ්‍යාව කොපමණද;

(iii) මරණ දඬුවමට ලක්වූවන්ගේ සහ ජීවිතාන්තය දක්වා සිරගතවූවන්ගේ යහපත් කල්ක්‍රියාව සළකා බලා ඔවුන්ට ලබා දී ඇති දඬුවම් ලිහිල් කිරීම අවසාන වශයෙන් සිදු කර ඇති දිනය කවරේද;

(iv) එවැනි දඬුවම් ලිහිල් කිරීමක් සිදු කර නොමැති නම්, එසේ කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5911/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තාවකාලික, අනියම් (දෛනික), ආදේශක සහ කොන්ත්‍රාත් පදනම් යටතේ රාජ්‍ය සේවයට බඳවා ගෙන දින 180ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුදෙනාගේ සේවය ස්ථිර කිරීමේ යෝජනාවක් 2015 අයවැය මගින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් වූ බවත්;

(ii) ඊට අදාළව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 නිකුත් වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ)(i) හි සඳහන් "දින 180 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති අය" යන්න 2015 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අතුරු අයවැය යෝජනා මගින් "අවුරුදු 07ක් රාජ්‍ය සේවයේ අනියම් පදනමින් සේවය කල අය" ලෙස වෙනස් කර තිබේද;

(ii) ඉහත අයවැය යෝජනා දෙක අතරින් ක්‍රියාත්මක වන්නේ කවර යෝජනාවද;

(iii) එම යෝජනාව අනුවත්, ස්ථිර නොකරන කම්කරුවන් තවදුරටත් අනියම් පදනම යටතේ සේවා අවශ්‍යතාවය අනුව සේවයේ යොදවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5918/'15

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— මහජන සාමය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනාධිපතිවරණ සමයේදී ත්‍රිකුණාමලය, නුවර පාරේ, මට්ටිකෙලි නමැති ස්ථානයේ තිබූ අවසරලත් මැතිවරණ මෙහෙයුම් කාර්යාලයට 2015.01.04 දින මැතිවරණ නිලධාරීන් ලෙස හඳුන්වාගත් පිරිසක් සහ පිටස්තර පිරිසක් පැමිණ කලහකාරීව හැසිරී, එහි තිබූ වීඩියෝ උපකරණ හා කාර්යාල උපකරණ පැහැරගෙන ගොස් ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අවස්ථාවේදී කාර්යාලයේ සිටි පිරිස පැමිණි පිරිසෙන් කළ කරුණු විමසීම මැතිවරණ නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීමක් ලෙස සලකන්නේද;

(ii) මැතිවරණ කාල සීමාවෙහි අනුමත කාර්යාලයක් තුළවත් තොරතුරු, චිත්‍රපට ආදිය ප්‍රදර්ශනය කිරීම, කථා පැවැත්වීම හෝ වෙනත් මැතිවරණ ප්‍රචාරක කටයුත්තක් සිදු කිරීමට නොහැක්කේද;

(iii) අපරාධ නඩු විධාන සංග්‍රහයේ දක්වා ඇති අයුතු ඇතුළුවීම, කලහකාරී ලෙස හැසිරීම යනාදී චෝදනා ඉහත (අ) හි සඳහන් ආකාරයට හැසිරෙන මැතිවරණ නිලධාරීන්ට අදාළ නොවන්නේද;

(iv) ඉහත කාර්යාලය තුළ කලහකාරීව හැසිරී, එහි උපකරණ පැහැර ගෙන ගොස්, කාර්යාලය පවත්වාගෙන ගිය අයට එරෙහිව නඩු පැවරීමට කටයුතු කර ඇති නිලධාරීන්ට එරෙහිව යහ පාලනය යටතේ ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5921/'15

ගරු විදුර වික්‍රමනායක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වගවත්ත ග්‍රාම නිලධාරී වසමේ රජයේ ඉඩම් කොටසක් සමාජ සේවා කටයුත්තක් සඳහා යන පදනමින් ලබා ගෙන පෞද්ගලික සමාගමක් විසින් වාණිජමය අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ ව්‍යාපාරයක් සඳහා යොදාගෙන ඇති බවත්;

(ii) ජල රක්ෂිත ඉඩමක පිහිටි ඉහත සමාගමේ ක්‍රියාකාරකම් හේතුකොට ගෙන ප්‍රදේශයේ ජනතාව පානීය ජලය ලබා ගන්නා මාවක්ඔයේ ජලය අපවිත්‍ර වන බවත්;

(iii) එම රක්ෂිත ඉඩම් ආපසු ලබා දෙන ලෙස අදාළ ආයතනයට ලිඛිතව දැනුම්දීමක් කර, එම දැනුම්දීමට අනුව ඉඩම භාරදීමට කටයුතු නොකළහොත් නැවත පවරා ගැනීමට පියවර ගන්නා බවට 2013 නොවැම්බර් 26 වැනි දින පවත්වන ලද ඉඩම් හා ඉඩම් සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභා රැස්වීමේදී එවකට ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා ප්‍රකාශ කර ඇති බවත්;

(iv) මෙතෙක් එම ආකාරයට කටයුතු කර නැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සඳහන් ඉඩම නැවත පවරා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5926/'15

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මාවිඇල - කිරිමැටියාව මාර්ගයේ දෙවන අදියර, පඩුවස්නුවර බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නිකටපිටිය - ඉහලගම මාර්ගයේ දෙවන අදියර සහ වඩුමුන්න - මඩන මාර්ගය යන මාර්ගවල කාපට් අතුරා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන අනුමත වී, කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කර එම සංවර්ධන කටයුතු ආරම්භ කළ බවත්;

(ii) මේ වන විට එම මාර්ග සංවර්ධන කටයුතු හදිසියේම නතර කර ඇති බවත්;

(iii) එබැවින් දැඩි අබලන් තත්ත්වයේ පවතින ඉහත මාර්ගයන්හි ගමනාගමන කටයුතු ඉතා දුෂ්කර වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගයන්හි සංවර්ධන කටයුතු නවතා දැමීමට හේතු කවරේද;

(ii) එකී මාර්ගයන්හි සංවර්ධන කටයුතු නැවත ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5940/'15

ගරු අනුර දිසානායක මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2000 සිට 2010 දක්වා කාල සීමාව තුළදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක ශාඛාවට බඳවා ගැනීම සඳහා සලකා බැලූ අධ්‍යාපන සුදුසුකම් වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2006 වර්ෂයේදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක ශාඛාව සඳහා බඳවා ගත් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වර්ෂයේදී බඳවා ගත් කණ්ඩායමට අයත් වූ යෝෂිත රාජපක්ෂ මහතාගේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) යෝෂිත රාජපක්ෂ මහතා ශ්‍රී ලංකා නාවික හමුදාවට බැඳුනු දිනය කවරේද;

(ii) ඔහු පුහුණුව සඳහා බ්‍රිතාන්‍යයේ රාජකීය නාවික ඇකඩමියට බැඳුනු දිනය කවරේද;

(iii) එම පාඨමාලාව සඳහා යෝෂිත රාජපක්ෂ මහතා තෝරා ගැනීමට අදාළ කරගත් නිර්නායක කවරේද;

(iv) ඔහු එම පුහුණුව අවසන් කළ දිනය කවරේද;

(v) එම පුහුණුව අවසානයේ පැවති විභාගවලින් ඔහු ලද ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6037/ 15

ගරු රාජීව විජේසිංහ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල්.ටී.ටී.ඊ. සංවිධානයට සම්බන්ධකම් ඇති පිරිසකට කොන්ත්‍රාත්තුවක් ලබා දුන්නේයැයි එක්සත් ජාතීන්ගේ හිටපු නිත්‍ය නියෝජිත වන ක්ෂේනුකා සෙනෙවිරත්න මහත්මියට එරෙහිව ඉදිරිපත් කර තිබූ චෝදනා පිළිබඳව; සහ

(ii) එක්සත් රාජධානියේ හිටපු මහ කොමසාරිස් ආචාර්ය ක්‍රිස් නෝනිස් මහතාට පහරදීමේ සිද්ධියෙන් පසුව සෙනෙවිරත්න මහත්මිය විසින් ඔහුට විරුද්ධව ඉදිරිපත් කර තිබූ චෝදනා පිළිබඳවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් චෝදනා එක්සත් ජාතීන්ගේ හිටපු නිත්‍ය නියෝජිතවරුන්ගෙන් කෙනෙකු වන තමරා කුනනායගම් මහත්මිය විසින් සෙනෙවිරත්න මහත්මිය සමඟ තිබූ පෞද්ගලික ආරවුලක් නිසා සිදු කළ බව මෑතකදී පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවකදී ඔහු ප්‍රකාශ කළ බවත්;

(ii) එසේ ප්‍රකාශ කිරීමට ඔහු සතුව සාක්ෂි තිබේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මෙම චෝදනා සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදුකර තිබේද;

(ii) එම චෝදනා පිළිබඳව වන විමර්ශන වාර්තා සභාගත කරන්නේද;

(iii) ඉහත (අ) (i) හි සඳහන් කොන්ත්‍රාත්තුව පිළිබඳව මහා භාණ්ඩාගාරයේ නියෝජිතයන් විසින් සකස් කරන ලද විගණන වාර්තාව කියවා තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4784/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයින තුළ වන අලි නිසා සිදුවන මිනිස් ජීවිත හානි සංඛ්‍යාව අවම කිරීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග කවරේද;

(ii) වන අලින්ගෙන් ආරක්ෂා වීම සඳහා මුළු දිවයිනටම අවශ්‍ය වී ඇති විදුලි වැටවල (අලි වැටවල) දිග ප්‍රමාණය පිළිබඳ දැනුවත් භාවයක් තිබේද;

(iii) එසේ නම්, එම අවශ්‍යතාව කොපමණද;

(iv) කුරුණෑගල දිස්ත්‍රික්කය සඳහා අවශ්‍ය විදුලි වැටවල දිග ප්‍රමාණය කොපමණද;

(v) විදුලි වැට ඉදිකිරීම සඳහා මෙවර අයවැයෙන් මුදල් වෙන් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4813/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි වී දැනට නිදහස් වෙළඳ කලාපය තුළ වාහන එකලස් කර විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සී/ස වෙහිකල්ස් ලංකා පුද්ගලික සමාගම විසින් අලෙවි කරනු ලබන මෝටර් රථ මාසයක් ඇතුළත ලියාපදිංචි කරන බවට මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ ලිපියක් ගැණුම්කරුවන්ට පෙන්වනු ලබන බවත්;

(ii) එසේ නමුත්, එම සමාගම මගින් විකුණන ලද වාහන ලියාපදිංචි කිරීම, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන බවත්;

(iii) ඒ හේතුවෙන් එම සමාගමෙන් මෝටර් රථ මිල දී ගෙන ඇති ගැණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් තම වාහන ධාවනය කිරීමට නොහැකිව දැඩි අපහසුතාවයකට පත්වී සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සී/ස වෙහිකල්ස් ලංකා පුද්ගලික සමාගමෙන් මිලදී ගන්නා ලද වාහන, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිකර ගැනීම සඳහා පහසුකම් සලසා දෙන්නේදැයි එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5223/'14

ගරු අශෝක් අබේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී සමස්ත බැංකු සංඛ්‍යාව කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම එක් එක් බැංකුවේ වත්කම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් බැංකුව මගින් රජයට ලබා දී ඇති ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) එම බැංකු මගින් රජයට ලබාදුන් ණය නැවත අය කර ගැනීම සඳහා ක්‍රමවේදයක් තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4819/'14

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් කුලී පදනම මත ලබා ගත් වායු සමනය කළ සුඛෝපභෝගී වාහන ගුවන් හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම වාහන සඳහා ඉන්ධන රජයෙන් ලබා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබා ගත් සුඛෝපභෝගී වාහන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම වාහන පරිහරණය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?